# ජන සංගණන පුවත්

## ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව
## මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය

**2011 ජුනි**

- ♣ ගොඩනැගිලි ලැයිස්තුගත කිරීම සාර්ථකව අවසන්
- ♣ සංගණන ලේබලය ඉවත් නොකරන්න
- ♣ අතිගරු ජනාධිපතිතුමා ගේ නිල නිවස ලැයිස්තුගත කිරීම
- ♣ ගොඩනැගිලි ලැයිස්තුගත කිරීමට සහයෝගය ලබාදුන් සැමට තුති

## ගොඩනැගිලි ලැයිස්තුගත කිරීම සාර්ථකව අවසන්

සියලුම දිස්ත්‍රික්කවල ක්ෂේත්‍ර නිලධාරීන්ගේ දැඩි කැපවීම හා දිස්ත්‍රික් පරිපාලනයේ අධීක්ෂණය හා සහයෝගය මත ජන හා නිවාස සංගණනයේ දෙවන අදියර වන ගොඩනැගිලි ලැයිස්තුගත කිරීම මේ වනවිට සාර්ථකව අවසන් වී ඇත. මෙම අදියරේ දී සම්පූර්ණ කරනු ලබන ලැයිස්තුගත කිරීමේ ලේඛනය ජන සංගණනයේ අවසාන ගණන් ගන්නා අදියරේ දී පුද්ගලයින් සාමාන්‍යයෙන් පදිංචි ස්ථාන හඳුනා ගැනීම සඳහා ප්‍රයෝජනවත් වේ. ලැයිස්තුගත කිරීමේ ක්‍රමවේදයට අනුව ලැයිස්තුගත කිරීමේ නිලධාරින් විසින් ලැයිස්තුගත කිරීමේ ලේඛන සම්පූර්න කොට ප්‍රාදේශිය සංගණන නිලධාරි මගින් දිස්ත්‍රික් කාර්යාල වෙත ලබා දිය යුතුය. දිස්ත්‍රික් සංඛ්‍යාලේඛන කාර්යාලයේ දී එම ලේඛනවල ඇතුලත් තොරතුරු පරිගණක ගත කිරීම සිදුවේ. මේ වන විට ප්‍රධාන කාර්යාලයේ මගපෙන්වීම හා අධීක්ෂණය යටතේ දිස්ත්‍රික් කාර්යාලවල නිලධාරීන් විසින් සංගණන කාණ්ඩ තොරතුරු පද්ධතිය (**MRCB**) සකස් කිරීම සාර්ථකව සිදුකරමින් පවති. සංගණනයේ ගණන් ගන්නා අදියර සැලසුම් කිරීමට හා තීරණ ගැනීමට අවශ්‍ය වන තොරතුරු සංගණන කාණ්ඩ තොරතුරු පද්ධතිය මගින් ඉතා පහසුවෙන් ලබාගැනීමට හැකිවේ. තවද දෙපාර්තමේන්තුව මගින් සිදුකරනු ලබන ඉදිරි සමීක්ෂණවල දී නියැදීන් තේරීම ද සංගණන කාණ්ඩ තොරතුරු පද්ධතිය ආශ්‍රයෙන් වඩා කාර්යක්ෂමව සිදුකළ හැක.

දිස්ත්‍රික් සංගණන සම්බන්ධීකරණ නිලධාරීන් විසින් ලැයිස්තුගත කිරීමේ අදියරේ දී උගත් පාඩම් හා ක්ෂේත්‍ර අත්දැකීම් සාකච්ඡා කිරීම සඳහා ජන සංගණන අංශයේ දී ජුනි මස 23 වන දා රැස්වන ලදී. විශාල නිලධාරීන් පිරිසක් සහභාගි වන සංගණනයේ අවසාන ගණන් ගැනීමේ අදියර සාර්ථකව සැලසුම් කිරීම සඳහා සැලකිල්ල යොමු කළ යුතු කරුණු පිළිබඳව මෙම රැස්වීමේ දී දිස්ත්‍රික් සංගණන සම්බන්ධීකරණ නිලධාරීන් පුළුල් ලෙස අදහස් දක්වන ලදී.

## සංගණන ලේබලය ඉවත් නොකරන්න

ලැයිස්තුගත කිරීමේ ක්‍රමවේදයට අනුව සියලුම ගොඩනැගිලි මේ වන විට ලේඛනගත කොට ඇත. ගොඩනැගිලි ලැයිස්තුගත කිරීමේ දී ලබා දුන් අංකය සහිත සංගණන ලේබලය මගින් සංගණනයේ ගණන් ගැනීමේ අදියරේ දී පුද්ගලයින් සාමාන්‍යයෙන් පදිංචි ස්ථාන අත්හැරීමකින් තොරව හඳුනාගැනීම තහවුරුවන බැවින් මෙම සංගණන ලේබලය සංගණනයේ පුද්ගල ගණන් ගැනීම සිදුවන තෙක් ඉවත් නොකරන මෙන් ජනතාව දැනුවත් කර ඇත.



## අතිගරු ජනාධිපතිතුමා ගේ නිල නිවස ලැයිස්තුගත කිරීම

සියලු ගොඩනැගිලි ලැයිස්තුගත කිරීම යටතේ කොළඹ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ පිහිටා ඇති ජනාධිපති නිල නිවස ලැයිස්තුගත කිරීමේ අවස්ථාවට අතිගරු ජනාධිපතිතුමන් ද සහභාගි විය. ඉතාමත් උනන්දුවෙන් එම අවස්ථාවට එක්වූ අතිගරු ජනාධිපතිතුමන් විසින් මෙම ජාතික කර්තව්‍ය සාර්ථක කර ගැනිමට මහජන සහයෝගය ලබා දෙන මෙන් මාධ්‍ය මගින් සියලු ජනතාවගෙන් ඉල්ලීමක් ද කරන ලදි. මෙම අවස්ථාවට මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ ලේකම්, නියෝජ්‍ය භාණ්ඩාගාර ලේකම්වරු, කොළඹ දිස්ත්‍රික් ලේකම්, ප්‍රදේශීය ලේකම් හා ජනලේඛන හා සංඛ්‍යාලේඛන අධ්‍යක්ෂ ජනරාල් ඇතුලු රාජ්‍ය නිලධාරින් රැසක් සහභාගි වන ලදි.

## ගොඩනැගිලි ලැයිස්තුගත කිරීමට සහයෝගය ලබාදුන් සැමට තුති

තිස් වසරකට පසු මුලු දිවයිනම ආවරණය කරමින් පැවැත්වෙන ජන හා නිවාස සංගණනය සාර්ථකව සිදුකිරීම සඳහා මහජන සහයෝගය ඉතාමත් වැදගත් සාධකයකි. රටක ප්‍රධාන සංගණනය පැවැත්වීම එහි සියලු පුරවැසියන්ගේ දායකත්වය මත සිදුවිය යුත්තක් බැවින් විවිධ මාධ්‍ය උපයෝගි කර ගනිමින් ජන හා නිවාස සංගණනය පිළිබඳව පුළුල් ප්‍රචාරක වැඩසටහනක් දියත් කරන ලදී. එහි ප්‍රතිඵලයක් ලෙස මෙවර ජන හා නිවාස සංගණනයෙහි ක්ෂේත්‍ර කටයුතු සිදුවන මූලික අවස්ථාව වන ගොඩනැගිලි ලැයිස්තුගත කිරීම සඳහා මහජනයා විසින් විශාල සහයෝගයක් ලබා දෙන ලදී.

දිවයිනේ සියලුම දිස්ත්‍රික්කවල ක්ෂේත්‍ර කටයුතු සාර්ථකව අවසන් කිරීමට සහයෝගය ලබා දුන් ලැයිස්තුගත කිරීමේ නිලධාරීන්ට, දිස්ත්‍රික් පරිපාලනයේ රාජ්‍ය නිලධාරීන්ට, සම්බන්ධීකරණ නිලධාරින් ඇතුලු ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ ක්ෂේත්‍ර සංඛ්‍යාලේඛන කාර්ය මණ්ඩලයට, සංගණන රාජකාරිවල දී සහාය දුන් වෙනත් සියලුම නිලධාරීන්ට, විද්‍යුත් හා මුද්‍රිත මාධ්‍ය ආයතනවලට හා තොරතුරු ලබා දුන් ශ්‍රී ලංකාවාසී සියලු දෙනාට දෙපාර්තමේන්තුවේ ස්තුතිය හිමිවේ. ඉදිරියේ දී පැවැත්වෙන ජන හා නිවාස සංගණනයේ ගණන් ගැනීමේ අදියරේ දී ද සියලු කටයුතු සාර්ථකව සිදුකිරීමට ඔබ සැමගේ සහයෝගය තවදුරටත් අපේක්ෂා කෙරේ.

**ජන සංගණන හා ප්‍රජා විද්‍යා අංශය , ජන ලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව ,**
**16/7 , ඇල්බට් ච්න්ද්‍රවංකය, කොළඹ 07.**

**දුරකතන අංක 011 2695940 /011 2689462** **විද්‍යුත් තැපැල** census@statistics.gov.lk